# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2401/39 - 2024 සැප්තැම්බර් මස 13 වැනි සිකුරාදා - 2024.09.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනත**

22 (1) (ආ) උප වගන්තිය යටතේ කටයුතු කිරීම පිළිබඳ දැන්වීම

2024 සැප්තැම්බර් 21 වැනි දින පැවැත්වීමට නියමිත ජනාධිපතිවරණය සඳහා 2024.08.15 දින නාමයෝජනා කරන ලදුව, අංක 2397/51 හා 2024.08.15 දින දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයෙන් ජනාධිපතිධුර අපේක්ෂකයෙකු ලෙස ප්‍රසිද්ධියට පත් කරන ලද, අයිඩෲස් මොහමදු ඉල්යාස් මහතා 2024.08.22 දින මිය ගොස් තිබීම හා එම මරණය සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාව සෑහීමකට පත් වීම මත, එම අපේක්ෂකයා නාමයෝජනා කළ තැනැත්තා වන කේ. එම්. එන්. සංජය සම්පත් රේමන් මහතා වෙත, වෙනත් අපේක්ෂකයෙකු නාමයෝජනා කරන ලෙස, 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ 22(1) උප වගන්තිය අනුව විධාන කරන ලද අතර, ඔහු විසින් එම විධානයේ දින සිට දින තුනක් ඇතුළත වෙනත් අපේක්ෂකයකු නාමයෝජනා කිරීම පැහැරහැර ඇති හෙයින්, එම පනතේ 22(1) (ආ) උප වගන්තිය අනුව ඡන්ද පත්‍රිකාව සහ ඡන්ද විමසීමට අදාළ සෙසු සියලු ලේඛනවලින් මියගිය අපේක්ෂකයාගේ නම ඉවත් කරනු ලැබ ඇත්තාක් මෙන් සලකා, එම පනතේ 107 වන හා 118 වන වගන්තිය යටතේ මැතිවරණ කොමිෂන් සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව ඊට අදාල ක්‍රියාමාර්ග ගන්නා බවත්, අංක 2394/51 හා 2024.07.26 දින *අති විශෙෂ ගැසට්* නිවේදනයේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට, ඡන්දය ගැනීම කරනු ලබන බවත් මෙයින් දන්වමු.

**ආර්. එම්. ඒ. එල්. රත්නායක,**
සභාපති,
මැතිවරණ කොමිෂන් සභාව.

**එම්. ඒ. පී. සී. පෙරේරා,**
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

**අමීර් ෆායිස්,**
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

**ඒ. ෂන්මුගනාදන්,**
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

මහාචාර්ය **ලක්ෂ්මන් දිසානායක,**
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

2024 සැප්තැම්බර් මස 13 වැනි දින,
සරණ මාවත, රාජගිරිය,
මැතිවරණ කොමිෂන් සභාවේ දී ය.

EOG 09 - 0116


1A - G 42702 — 19 (2024/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*